www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනයේ ආරක්ෂක වාර්තාව වර්ධනය වන යුද අනතුරු මතු කර දක්වයි

**China's defence report highlights growing dangers of war**

**ජෝන් චැන් විසිනි**
**2007 ජනවාරි 18**

චීනයේ මිලිටරිමය සහ මූලෝපායික තක්සේරුව අඩංගු කර ගත් අතිශයින්ම දේශපාලනික ලියවිල්ලක් 2006 වසරේ ජාතික ආරක්ෂාව නමින් දෙසැම්බර් අග භාගයේ දී පලකරන ලදී. එය මහා බලවතුන්ගේ වැඩෙන එදිරිවාදිකම් කෙරෙහි බීජිංහි ප්‍රතිචාරය පිලිබිඹු කරයි.

1998 වසරින් අනතුරුව පලකරන ලද පස් වැනි ධවල පත්‍රිකාව වූ මේ ලියවිල්ල වොෂින්ටනයෙන් එල්ල වන එන්ට එන්ටම වැඩිවන පීඩනයට දක්වූ ප්‍රතිචාරයකි. 2001 වසරේ බුෂ් බලයට පැමිනීමෙන් පසුව චීනය එක්සත් ජනපදයට තර්ජනයක් ලෙස විදහා දක්වෙන පෙන්ටගනයේ වාර්ෂික වාර්තා පෙලක් පලකර ඇත. සිය රට "සාමකාමී නැග්මක" නිරත වී සිටින බව පවසමින් චීන ජනාධිපති හූ ජින්ටාවෝ මෙම විවේචන ලඝු කොට දක්වීමට උත්සුක විය.

චීනයේ හමුදා තර කිරීම "රහස්‍ය" ස්වභාවයක් ගන්නා බවට වොෂින්ටනය විසින් කරන ලද ප්‍රකාශවල සැර බාල කිරීමේ ප්‍රයත්නයක යෙදෙමින් මෑතම වාර්තාව තුල රටෙහි මිලිටරි පද්ධතිය සම්බන්ධයෙන් කලින් ඒවාට වඩා විස්තරාත්මක තොරතුරු ඇතුලත් ය. ආරක්ෂක වියදම් හා මෙහෙයුම් ව්‍යුහය පිලිබඳ තොරතුරු ද ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පුලුල් දර්ශනයක් ද එමගින් ඉදිරිපත් කෙරිනි. ආන්ඩුව මෙම වාර්තාව සම්බන්ධයෙන් රටවල් 45ක හමුදා නිලධාරින් 70ක ගේ සහභාගිත්වයෙන් විශේෂ පුවත්පත් සාකච්ඡාවක් ද පැවත්විය.

එසේ වුවද, චීනයේ ආර්ථික ගාමක බලය තුල එයට ම සුවිශේෂ වූ වාස්තවික තර්කයක් ඇත. සියයට 10ක සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකයක් හා ඩොලර් ට්‍රිලියනයක විදේශීය මුදල් සංචිත සතු චීනයට මහජන විමුක්ති හමුදාව වෙනුවෙන් (පීඑල්ඒ) ආයෝජන වර්ධනය කිරීමට හැකිව ඇත. තව ද, ඛනිජ තෙල් හා අමුද්‍රව්‍ය සඳහා ලෝකය පුරා සැරිසරන චීනය, එමගින් එක්සත් ජනපදය, ජපානය හා යුරෝපීය බලවතුන් සමග ඍජු තරගයකට මුලපුරා ඇත.

ෂැංහයි සහයෝගිතා සංවිධානය (එස්සීඕ) තුල රුසියාව සමග වර්ධනය වන බැඳීම් හේතු කොට ගෙන චීනය, මැද පෙරදිගෙහි හා මධ්‍යම ආසියාවෙහි ආධිපත්‍යය පතුරුවීමේ එක්සත් ජනපද අභිලාෂයන්ට අවහිරයක්ව තිබේ. සම්පත් සඳහා හිලව් වසයෙන් ආධාර සැපයීමට ඉදිරිපත් වෙමින් ආසියාව, ලතින් ඇමරිකාව හා අප්‍රිකාව තුල චීනය සිය බලපෑම විහිදුවීමෙහි නිරතව සිටියි. වොෂින්ටනය විවෘතවම සතුරු ආකල්පයක් දක්වන සුඩාන, වෙනිසුයුලා හා බුරුම පාලන තන්ත්‍රයන්ට චීනය ආයුධ පවා සම්පාදනය කරමින් සහාය දක්වා තිබේ.

මැද පෙරදිගෙහි මෙන් ම ජාත්‍යන්තරව ද බුෂ් පාලන තන්ත්‍රයෙහි කඩාවැදීම් අරබයා බීජිංහි වර්ධනය වන උත්සුකයන් ආරක්ෂක වාර්තාවෙන් පෙන්නුම් කරයි. " සිය මිලිටරි වාතාවරනය වෙත යොමු වෙමින් ජාත්‍යන්තර කටයුතුවල දී බලය යෙදවීමට හෝ බලය යෙදවීමට තර්ජනය කරමින් හා සිය මිලිටරි සන්ධානයන් තර කිරීමේ යෙදී සිටින රටවල් කිහිපයක චරියාව" පිලිබඳව එම වාර්තාවේ පලමු පරිච්ඡේදයෙන් අනතුරු අඟවා ඇත.

ආසියාව තුල ඇතිවන එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් යුත් මූලෝපායික යලි පෙල ගැස්මක අනතුර ගැන විශේෂයෙන් එම පරිච්ඡේදයෙන් අනතුරු ඇඟවිනි. "ක්‍රියාන්විත ඒකාග්‍රකරනය අනුගමනය කරන එක්සත් ජනපදය හා ජපානය ඔවුන්ගේ මිලිටරි සන්ධානය ශක්තිමත් කරමින් සිටී. ජපානය සිය ව්‍යවස්ථාව සංශෝධනය කරමින් සාමූහික ස්වයං-ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමට උත්සුක වෙයි. ජපානයෙහි මිලිටරි ඉරියව් වඩාත්ම පිටතට නැඹුරු ස්වරූපයක් ගනී. ප්‍රජාතන්ත්‍රීය මහජන කොරියානු සමූහාන්ඩුව (උතුරු කොරියාව) මිසයිල හා න්‍යෂ්ටික අත්හදාබැලීම්වල යෙදී ඇත. මේ අනුව, කොරියානු අර්ධද්වීපයෙහි හා ඊසාන දිග ආසියාවෙහි තත්වය වඩාත් සංකීර්න හා අභියෝගාත්මක ස්වරූපයක් ගෙන තිබේ."

බුෂ් පාලන තන්ත්‍රය විසින් ඊසාන දිග ආසියාවෙහි වඩාත් කලහකාරී භූමිකාවක් රඟපෑම පිනිස ජපානයට

අනුබල දීම චීනයේ ඉමහත් කනස්සල්ලට හේතු වී ඇත. උතුරු කොරියාව විසින් ඔක්තෝබර් මස කරන ලද න්‍යෂ්ටික අත්හදාබැලීම ජපානයට න්‍යෂ්ටික ආයුධ තැනීමට නිමිත්තක් සපයනු ඇතැයි බීජිං තුල බියක් පවතී. උතුරු කොරියාවෙහි "පාලන තන්ත්‍ර වෙනසක්" සඳහා බුෂ් පාලනාධිකාරය විසින් යොදන යාන්තමින් සැඟවුනු පීඩනය චීනයේ එලිපත්තෙහි දේශපාලනිකව සතුරු රාජ්‍යයක් බිහි වීමේ තර්ජනය එල්ල කරයි.

එක්සත් ජනපදයෙහි සහාය ඇතිව විධිමත් ලෙස තායිවානය ස්වාධීනත්වය ප්‍රකාශකිරීමක් චීනයෙහි ජාතික ආරක්ෂාව හා භෞමික අඛන්ඩතාවයට එල්ල විය හැකි බරපතල ම තර්ජනය බව එම පත්‍රිකාව නිශ්චිතව ම සඳහන් කරයි. බීජිනය සලකන්නේ තායිවානය භ්‍රෂ්ට ප්‍රාන්තයක් ලෙස ය. එහි ස්වාධීනත්වය දෙසට තබන පියවර චීනයේ වෙනත් තැන්වල බෙදුම්වාදී ව්‍යාපාරවලට අනුබල දෙන්නක් වනු ඇතැයි බීජිංහි බියක් පවතී. චීනය එල්ල කරන ප්‍රහාරයකින් තායිවාන දූපත මිලිටරිමය වසයෙන් ආරක්ෂා කිරීමට එක්සත් ජනපදය ප්‍රතිඥා දී ඇත. ඊටත් වඩා වැදගත් වන්නේ තායිවානය සම්බන්ධයෙන් ගන්නා ඕනෑ ම මිලිටරි ක්‍රියාදාමයකට සහායවීමට එක්සත් ජනපදය ජපානයට අනුබල දීමයි.

චීන දේශසීමාව හා වෙරල තීරය ආසන්නව පිහිටි රටවල් ගනනාවක් සමග වොෂින්ටනය මිලිටරි සන්ධානයන් හෝ මූලෝපායික එකඟතාවන් ගනනාවක් ඇති කර ගෙන තිබේ. මේ අතරට දකුනු කොරියාව, ජපානය, තායිවානය, ඉන්දියාව, පකිස්තානය, නේපාලය හා ඇෆ්ගනිස්තානය ද මධ්‍යම ආසියානු රටවල් ගනනාවක් ද අයත් වේ. මේ තර්ජනාත්මක වැටලීමට ප්‍රතිචාරයක් වසයෙන් ද අමුද්‍රව්‍ය, විශේෂයෙන්ම, ඛනිජ තෙල් සැපයුම සහතික කිරීම සඳහා ද චීනය සිය මිලිටරිය තර කරමින් සිටී.

මෙම වර්ෂය තුල චීනයෙහි ආරක්ෂක වියදම යුවාන් බිලියන 283.8ක් හෝ එක්සත් ජනපද ඩොලර් බිලියන 36.4ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය 2005 වසරෙහි දරන ලද වියදමට වඩා සියයට 15කට ආසන්න වැඩි වීමකි. 1990-2005 දක්වා චීනයේ මිලිටරි පිරිවැයේ සාමාන්‍ය වාර්ෂික වර්ධනය සියයට 15.36ක් විය. මෙය වැඩි වසයෙන්ම හමුදාවේ වැටුප් ගෙවීම් සඳහා වැය කරන බව පවසමින් ධවල පත්‍රිකාව එහි සැර බාල කිරීමේ ප්‍රයත්නයක යෙදුනි. එක්සත් ජනපදයේ මිලිටරි වියදම දල දේශීය නිෂ්පාදිතයෙන් (ජීඩීපී) සියයට 6.2ක්ව තිබිය දී චීනයේ එය සියයට 1.4ක් පමනක් බව ද එම පත්‍රිකාවෙන් ප්‍රකාශ වුනි.

1983 හා 1997 වසරවල දී චීනය සිය හමුදා භට සංඛ්‍යාව විශාල වසයෙන් එනම් මිලියන 1 1/2 කින් අඩු කර තිබේ. 2003 සහ2005 වසර අතර තවත් දෙලක්ෂයකින් භට සංඛ්‍යාව අඩු කලේ ය. මහජන විමුක්ති හමුදාව (පීඑල්ඒ) තුල දැනට සිටින භට පිරිස මිලියන 2.3කි. එය ලොව විශාලතම හමුදාව යි. මෙයට අමතරව, හයලක්ෂ හැටදාහකින් සමන්විත මහජන පොලිස් හමුදාවක් චීනය සතු වේ. එය යොදාගනුයේ ප්‍රධාන වසයෙන්ම දේශීය කැලඹිලි මැඩ පැවැත්වීම සඳහා ය.

චීනයේ වාර්ෂික මිලිටරි පිරිවැය, ලේඛනය තුල නිල වසයෙන් දක්වා ඇති සංඛ්‍යාවන් මෙන් දෙතුන් ගුනයක් වැඩි වෙතැයි පෙන්ටගනය ප්‍රකාශ කරයි. මෙයට හේතුව ආයුධ මිලදී ගැනීම් හෝ මිලිටරි ව්‍යාපාරවලින් ලැබෙන ආදායම චීනය සිය ආරක්ෂක පිරිවැයට එකතු නොකිරීම ය. ඇමරිකානු විශ්ලේෂකයන් වැඩිවන එක්සත් ජනපද මිලිටරි පිරිවැය සාධාරනය කිරීම සඳහා චීන "තර්ජනය" අතිශයෝක්තියට නැංවීම සම්බන්ධයෙන් පෙන්ටගනයෙහි තක්සේරු මත වරද පටවයි. 1990 ගනන්වල පටන් චීනයෙහි හමුදා නවීකරනයෙහි වේගය නිසැකවම වර්ධනය වී ඇත.

1970 ගනන් වන තෙක් මාවෝසේතුංගේ ගොවීන් මත පදනම් වූ මහජන විමුක්ති සංවිධානය (පීඑල්ඊ) සන්නද්ධව සිටියේ දුබල ලෙසට ය. එක්සත් ජනපදයේ හෝ සෝවියට් සංගමයේ ආක්‍රමනයක් හමුවේ එහි ප්‍රධාන උපක්‍රමය වූයේ ආක්‍රමනිකයින් වටලෑම "මිනිස් සාගරයක්" ඇති කර ගැනීම ය. 1980 ගනන්වල සෝවියට් සංගමයට ප්‍රතිවිරුද්ධ බලවේගයක් ලෙස චීනය යොදා ගැනීමට එක්සත් ජනපදය උත්සුක වූ අතර " වෙලඳපොල ප්‍රතිසංස්කරනවල" ආදායම් සිය මිලිටරිය නවීකරනය කිරීම සඳහා යොදාගැනීමට එක්සත් ජනපදය චීනයට සක්‍රියව අනුබල දුනි.

සෝවියට් සංගමයේ කඩාවැටීමත් සමග 1990-91 වසර තුල දී අති මූලික වෙනසක් සිදු විය. පලමුවැනි ගල්ෆ් යුද්ධයෙහි දී එක්සත් ජනපදය විසින් ඉරාක හමුදාවට අත් කර දුන් විනාශකාරී පරාජය චීන ජෙනරාල්වරුන් කම්පනයට පත් කලේ ය. අධිතාක්ෂනික යුද උපක්‍රම ඉස්මතු වූ "මිලිටරි විප්ලවයක" නව යුගයක් ලෙස බීජිනය එය අර්ථ නිරූපනය කලේ ය. භුගෝලීය මූලෝපායික ආධිපත්‍ය මුදුන්පත් කර ගැනීම සඳහා එක්සත් ජනපදය සිය හමුදා ශක්තිය යොදාගන්නා තත්වයක් තුල මහජන විමුක්ති හමුදාව එක්කෝ ඊට සමීප විය යුතු ය. නැත්නම් යටත් විය යුතුයි චීන නායකත්වය කියා සිටියේ ය.

එසේ වුවද, 1989 වසරේ තියනන්මෙන් චතුරස්‍රයෙහි සිදු කල සමූල ඝාතනයෙන් අනතුරුව ප්‍රධාන බටහිර බලවතුන් චීනයට එරෙහිව ආයුධ සම්බාධක පනවනු ලැබිනි. ඒ අනුව චීනය රුසියාව වෙත හැරුනු අතර ප්‍රහාරක ජෙට්යානා, ප්‍රහාරක සබ්මැරීන් හා දියුනු මිලිටරි තාක්ෂනය සඳහා එහි විශාලතම ගනුදෙනුකරුවා විය. තායිවානයෙහි නැගීඑන ස්වාධීනතා ව්‍යාපාරය බීජිංහි ක්ෂනික අවධානයට ලක්ව තිබුනත් නැගී එන එක්සත්

ජනපදයෙහි වටලෑමට එරෙහිව උපක්‍රම යෙදීම ද එහි අවශ්‍යතාවකි.

2006 ධවල පත්‍රිකාවෙහි "ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය" සම්බන්ධ කොටසෙහි දී 2050 වසර වන විට අධිතාක්ෂනය මත පදනම් වූ මිලිටරියක් ගොඩනැගීමේ චීනයෙහි අරමුන සවිස්තරාත්මකව දක්වයි. අභිප්‍රාය වනුයේ "යාන්ත්‍රිකකරනය පදනම වසයෙනුත් තොරතුරු තාක්ෂනය ගාමක බලවේගය වසයෙනුත්" යොදා ගැනීම යි. වාර්තාව තුල කේන්ද්‍රීයව අවධාරනය වනුයේ "සක්‍රීය ආරක්ෂාවක්" හා චීනයට ආසන්නතම කලාපයෙහි උපරිම අධිතාක්ෂනික වෙඩි බලයෙන් සමන්විත සම්බන්ධීකරනය වූ මිලිටේරි බලවේගයක් වේගයෙන් ඉදිරියට ගෙන ඒමයි.

චීනයේ ආර්ථික වර්ධනය වේගවත් වුවද, එය පරිපූර්න කාර්මික බලවතෙකු නොවේ. එහි ගුවන් යානා, යුද ටැංකි හා යුද නැව්වලට නව පරපුර විශාල වසයෙන් අනුකරනයන් හා එයට අත් කරගත හැකි සීමිත විදේශීය තාක්ෂනය යොදා ගැනීම මත පදනම් වේ. මහජන විමුක්ති හමුදාව මෙතෙක් පූර්න වසයෙන් යාන්ත්‍රිකව සන්නද්ධ වූ යුද හමුදාවක් ගොඩනගා නැත. අඩු අධ්‍යාපන මට්ටමක් සහිත බලයෙන් බඳවා ගන්නා ලද ගැමියන් ගෙන් සැදුම්ලත් එය "තොරතුරු තාක්ෂනය මත පදනම් වූ මිලිටරි ක්‍රමෝපායන්ට" එරෙහිව සටන් කිරීමට අපොහොසත් වෙයි. චීනය න්‍යෂ්ටික බලය මත පදනම් වූ සබ්මැරීන තනා ඇති නමුදු නාවික හමුදාවක් ගොඩනගා නැත. එහි ගුවන් හමුදාව නිවැරදි ඉලක්ක මත මෙහෙයවන ආයුධවලින් සන්නද්ධ වුවද එහි සංඛ්‍යාත්මක ශක්තිය තවමත් පදනම් වනුයේ යල් පැන ගිය සෝවියට් ජෙට් යානා මතය.

න්‍යෂ්ටික අවි ක්ෂේත්‍රයෙහි චීනය සිටිනුයේ එක්සත් ජනපදයට බෙහෙවින් පසුපසින් ය. තමන් "පලමුවෙන් භාවිතයට නොගන්නා" රටෙහි නිල න්‍යෂ්ටික ප්‍රතිපත්තිය ධවල පත්‍රිකාව තුල යලි අවධාරනය කල අතර චීනය න්‍යෂ්ටික ආයුධ තරගයක නොයෙදෙන බැව් ද ඉන් ප්‍රකාශ කෙරින. එහෙත් රටෙහි න්‍යෂ්ටික අවි තොග සම්බන්ධයෙන් එම ලියවිල්ලෙහි කිසිවක් සඳහන් නොවුනු තරම් ය.

නව මාදිලියේ න්‍යෂ්ටික යුද්ධ වෙනුවෙන් එක්සත් ජනපද වියදම් සාධාරනය කරනු වස් පෙන්ටගනය සහ සීඅයිඒ සංවිධානය චීනයේ න්‍යෂ්ටික "තර්ජනය" ඕනෑකමින් ම අතිශයෝක්තියට නංවා ඇති බවට ඇමරිකානු විද්‍යාඥයින්ගේ සමිති සම්මේලනය හා ස්වාභාවික සම්පත් ආරක්ෂක මන්ඩලය මගින් නොවැම්බර් මස ප්‍රකාශකල "චීන න්‍යෂ්ටික බලය හා එක්සත් ජනපද න්‍යෂ්ටික යුද සැලසුම්" යන මැයෙන් යුතු අධ්‍යයනයකින් කියැවුනි.

"චීනය ඊ ලඟ බලගතු තර්ජනය වන අතර ඒ හේතුවෙන් නව ආයුධ හා වැඩිපුර මිලිටරි වියදම් අවශ්‍ය වන බවට එක්සත් ජනපදයෙහි ඇතැමුන් තර්ක කරති. මෑතක දී එක්සත් ජනපදය මෙහෙයවූ යුද්ධ, මිලිටරි නවීකරනයන්, ආක්‍රමනශීලී මූලෝපායන් හා ප්‍රතිපත්ති ඇමරිකා "අධිපතිවාදය" ඔප්පු කරන්නක් ලෙස චීනයෙහි ඇතැම්හු දකිති. එබැවින් එය මිලිටරිය නවීකරනය කිරීමේ අවශ්‍යතාවය ගැන ඔවුන් කතා කරති. යුද සැලසුම් සඳහා රටවල් දෙකම විශාල මුදල් සම්භාරයක් ආයෝජනය කරමින් සිටිති. තවද, එක්සත් ජනපදය හා චීනය අතර ඇතිවන යුද්ධයකදී න්‍යෂ්ටික අවි පාවිච්චි කිරීමේ විභවය වැඩි වී ඇතැ"යි එම අධ්‍යයනය අනතුරු ඇඟවීය.

එක්සත් ජනපදය ගොඩගසාගෙන ඇති 10,000 ක් වන න්‍යෂ්ටික අවි තොගය හමුවේ චීනය අඟුටුමිට්ටෙකි. සාපේක්ෂව චීනය සතුව ඇතැයි ගනන් බලන න්‍යෂ්ටික අවි තොගය 200කි. එක්සත් ජනපදයට පහරදීමේ හැකියාව ඇති චීනය සතු අන්තර්-මහාද්වීප බැලිස්ටික මිසයිල (අයිසීබීඑම්) සංඛ්‍යාව 20ක් පමනි. ඊට සාපේක්ෂව චීනයට පහරදිය හැකි එක්සත් ජනපදය සතු එම මිසයිල සංඛ්‍යාව 830කට අධික ය. මීන් වැඩි ගනනක් බහු ආංගික න්‍යෂ්ටික බෝම්බවලින් සමන්විත වේ. මීට අමතරව, න්‍යෂ්ටික තාක්ෂනය, න්‍යෂ්ටික අවි දියත් කිරීමේ හැකියාව ඇති මූලෝපායික සබ්මැරීන හා න්‍යෂ්ටික ගුවන් ප්‍රහාරක හැකියාව යන ක්ෂේත්‍ර අතින් ද එක්සත් ජනපදය, චීනයට වඩා බොහෝ ඉදිරියෙන් සිටී.

සීමිත න්‍යෂ්ටික ගැටුමකින් වුවද ඉමහත් අනතුරු සිදු විය හැකි බව එම අධ්‍යයනයෙන් තක්සේරු කෙරුනි. චීනය සතු අන්තර්-මහාද්වීපික බැලිස්ටික මිසයිල (අයිසීබීඑම්) ගබඩා කර ඇති පොලොව යට කුටි 20 කට පමනක් වුව එක්සත් ජනපද න්‍යෂ්ටික ප්‍රහාරයක් එල්ල වුවහොත් මිලියන 26ක ජනකායක් මියයෑමට හා තුවාල ලැබීමට ලක් වනු ඇත. අතීතයේ චීනයට එරෙහිව "එයටත් වඩා පුලුල් ප්‍රහාර" එල්ල කිරීමට එක්සත් ජනපදය සැලසුම් කර තිබූ බව ද අවසානයේ කියැවින. තමන් සතු න්‍යෂ්ටික මිසයිල 20 යොදා ගනිමින් මහාද්වීපික එක්සත් ජනපදය වෙත ප්‍රහාරයක් එල්ල කල හොත් මිලියන 40ක් අනතුරට පත්වනු ඇතැයි එහි ගනන් බලා ඇත. එක්සත් ජනපදය ප්‍රකාශ කරන පරිදි, චීනයට න්‍යෂ්ටික බෝම්බ 75ක් 100ක් අතර ප්‍රමානයක් යොදා ගත හැකිවුව හොත් මේ අනතුරු සංඛ්‍යාව බොහෝ සෙයින් ඉහල යනු ඇත.

කෙසේවුවද න්‍යෂ්ටික ප්‍රමුඛතාව අත්පත් කර ගැනීමට - එනම් පලමු ප්‍රහාරයකට ප්‍රතිචාර වසයෙන් න්‍යෂ්ටික ප්‍රතිප්‍රහාරයක් වැලැක්වීමේ හැකියාව ලබා ගැනීමට - එක්සත් ජනපදය යත්න දරන බවට සංඥා නිකුත් වී ඇත. එවැන් හැකියාවක් මූලෝපායික සමීකරනය අතිමූලිකව වෙනස් කරනු ඇත. සීතල යුද සමයේ මේ මූලෝපායික සමීකරනය පදනම් වූයේ අන්‍යොන්‍ය විනාශය සහතික වූ රටාවක් මත ය - එනම්, අතිවිශාල

ප්‍රතිප්‍රහාරයකට ඇති බිය හේතු කොට ගෙන පාර්ශ්වයන් දෙකෙන් එකක්වත් පලමු ප්‍රහාරය දියත් නොකර මුහුනට මුහුන ලා සිටීම මතය. බුෂ් පාලන තන්ත්‍රය සිය ප්‍රහාරාත්මක න්‍යෂ්ටික හැකියාව ඔප්නංවමින් සිටිනවා පමනක් නොව, එල්ල වන ප්‍රතිප්‍රහාරයන් අවම කිරීම ඉලක්ක කොට ගත් ප්‍රති-බැලිස්ටික මිසයිල පද්ධතියක් ගොඩනැගීමෙහි නිරතවී සිටී.

එක්සත් ජනපද ප්‍රහාරයක විභව ඉලක්කවන චීනයට සහ රුසියාවට පලමු ප්‍රහාරයක් මග හරිනු වස් නව පන්නයේ ජංගම අන්තර් මහාද්වීපික බැලිස්ටික් මිසයිල තැනීම තුලින් ප්‍රතිචාර දක්වීමට බලකෙරී ඇත. බුෂ් පාලන තන්ත්‍රය චීනයේ "රහස්‍ය" ආරක්ෂක ව්‍යාපෘති පුනපුනා විවේචනයට ලක් කොට ඇත. එනමුදු එම පාලන තන්ත්‍රයෙහි මිලිටරි වර්ධනය හා ඉරාක හා ඇෆ්ගනිස්තාන ආක්‍රමනයන් ලෝක දේශපාලනයෙහි අස්ථාවර බවේ ප්‍රමුඛ සාධකය බවට පත්ව ඇති අතර යුද අනතුර තීව්‍ර කරයි.

© www.wsws.org